ඉන්ෆෝමේෂන් කොමියුනිකේෂන් ටෙක්නොලොජි ඒජන්සි ඔෆ් ශ්‍රී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම - 2023

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ඉන්ෆෝමේෂන් කොමියුනිකේෂන් ටෙක්නොලොජි ඒජන්සි ඔෆ් ශ්‍රී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්"සමාගම" සහ එහි පරිපාලිතයේ "සමූහය" 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ ලාභ හෝ අලාභ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලටඅනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	ප්‍රමිතියට අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අ)	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය විසින් සමාගම වෙත ලබාදී තිබුණු රු.32,363,150 ක් එම ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සමාගමේ වෙනත් ආදායම් ගිණුමට ගලපා තිබූ අතර ඒ හේතුවෙන් සමුච්චිත ඌණතාවය එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි. ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය විසින් නැවත මුදල් ලබාදෙන ලෙස 2022 වර්ෂයේදී ඉල්ලා ඇතත් ඒ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 ප්‍රකාරව ප්‍රතිපාදන සලසා නොතිබුණි.	මෙම ආපසු ගෙවියයුතු මුදල් 2017 අප්‍රේල් මාසය සඳහා වැටුප් ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් මුදල් නොලැබුණු බැවින් වැටුප් ලබාදීම සඳහා යොදවා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය උපදෙස් මත තාක්ෂණ අමාත්‍යාංශය හරහා ඍජුවම ජාතික බුද්ධිමය දේපල කාර්යාංශය වෙත ගෙවන ලෙස භාණ්ඩාගාරයෙන් ඉල්ලා ඇත.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය.
ආ	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07 හි 20 ඡේදයට පටහැනිව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේ දී මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී සමාලෝචිත වර්ෂයේ ගෙවනලද රු.13,909,600 ක් වූ පාරිතෝෂිත වටිනාකම මුදල් නොවන ගැලපීම් යටතේ දක්වා තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් අත්පත්කර ගැනීම සඳහා යොදවන ලද රජයේ ප්‍රාග්ධන ප්‍රදාන රු. 68,151,282 ක් සහ වෙනත් ව්‍යාපෘති අරමුදල් රු. 1,813,000 ක් මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යොදවනලද මුදල් ලෙස දක්වා නොතිබුණි.	මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ හඳුනාගෙන ඇති මෙහෙයුම් මුදල් ප්‍රවාහයන්ට කිසිදු බලපෑමක් නොකරන අතර ඉදිරිපත් කිරීමේ දෝෂයක් පමණක් පිළිබිඹු කරයි.	මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ප්‍රමිතයට අනුකූලව පිළියෙල කළ යුතුය.
ඇ	සමාලෝචිත වර්ෂයේදී සමාගමේ පාරිතෝෂිත දීමනා වෙන් කිරීමේ ප්‍රතිපත්තිය වෙනස් කිරීම හේතුවෙන් සිදුවූ පාරිතෝෂිත ඌන වෙන් කිරීම වූ රු. 1,559,540 ක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 හි 22 වන ඡේදය ප්‍රකාරව ලාභ අලාභ ගිණුමේ ආරම්භක සමුච්චිත ශේෂයට ගලපනු වෙනුවට සමාලෝචිත වර්ෂයේ විස්තීරණ ආදායම් ප්‍රකාශයට ගලපා තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේ සේවක පාරිතෝෂිත වෙන්කිරීම වූ රු. 11,903,300 ක් ලාභ අලාභ ගිණුමට ගලපනු වෙනුවට විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ගැලපීම හේතුවෙන් අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	පාරිතෝෂිකය සඳහා වන ප්‍රතිපාදන පූර්ව මූල්‍ය කාල පරිච්ඡේදවල භාවිතා කරන ලද ක්‍රියාකාරී ක්‍රමය භාවිතා කිරීමට වඩා සැබෑ නෛතික බැඳීම මත පදනම්ව ගණනය කර ඇත. මෙම වෙනස මූල්‍ය ප්‍රකාශන සමඟ ඇති සටහන්වල නිසි ලෙස අනාවරණය කර ඇත.	ගිණුම්කරණ ප්‍රමිතයට අනුකූලව පාරිතෝෂිත වෙන්කිරීම ගිණුම් තැබිය යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අ)	විවිධ ව්‍යාපෘතීන්ගෙන් සමාගම වෙත ලැබී තිබූ රු. 4,986,669 ක් වූ සමුච්චිත අරමුදල්, ව්‍යාපෘති අවසන්වීමෙන් පසු ආදායම් ලෙස ගිණුම්ගත කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂය අවසානය වන විට ගෙවිය යුතු ව්‍යාපෘති පරිපාලන ශේෂයක් ලෙස ජංගම වගකීම් යටතේ දක්වා තිබීම හේතුවෙන් එම වටිනාකමින් ජංගම වගකීම් වැඩියෙන් දක්වා තිබුණි.	බාහිර ව්‍යාපෘතිවල පරිපාලන වියදම් පියවා ගැනීමට තිබෙන මුදල් ශේෂය සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති සඳහා ලාභ අලාභ ගිණුමේ ආදායම ලෙස හඳුනා ගැනීමට අසමත් වූ බව පිළිගනිමු.	අවසන් වූ ව්‍යාපෘතිවල ඉතිරි මුදල් ආදායමට ගත යුතුය.
ආ)	2022 අප්‍රේල් 20 සිට මාස 24ක කාලයක් සඳහා ලංකා ගවර්මන්ට් නෙට්වර්ක් 2.0(LGN 2.0) හි සේවා සැපයීම වෙනුවෙන් ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී සමාගම සමග පැවති ගිවිසුමට අනුව 2023/2024 කාලපරිච්ඡේදය සඳහා අයකරනු ලබන එකවර ගෙවිය යුතු රු.743,113,857 ක ගාස්තුවේ ඇතුළත් 2024 ජනවාරි සිට අප්‍රේල් 19 දක්වා කාලපරිච්ඡේදයට අදාළ රු.265,372,068 ක් සමාගම ගෙවා නොතිබියදී, සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විලම්බිත වියදම් ලෙස දක්වනු වෙනුවට කලින් ගෙවීම් ලෙස දක්වා තිබුණි.	2023 දෙසැම්බර් 22 වැනි දින වගකීම පැන නගින බැවින් එක් වරක් ගෙවීම සටහන් කළ යුතුය. මීට අමතරව, 2024 වර්ෂයට අදාළ බලපත්‍ර වගකීම් සහතිකය, ආධාරක සහ නඩත්තුව සඳහා රු. 265,372,068 ක වටිනාකම 2023 වර්ෂය සඳහා වන වියදම්වලට අදාළ නොවන බැවින් එය පෙරගෙවීමක් ලෙස සටහන් කළ යුතුය.	වර්ෂය තුළ සිදුකරන ලද කලින් ගෙවීම් පමණක් කලින් ගෙවීම් ලෙස ගිණුම්ගත කළ යුතු අතර,කලින් ගෙවිය යුතු එහෙත් ගෙවා නොමැති වියදම් විලම්බිත වියදම් ලෙස ගිණුම්ගත කළ යුතුය.
ඇ)	සේවා සැපයීම වෙනුවෙන් ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක් පුද්ගලික සමාගම වෙත ගෙවිය යුතුව තිබූ රු.19,043,375 ක් වෙනුවෙන් නිකුත් කර තිබූ 2023 දෙසැම්බර් 31 දිනැති මුදල් මාරුකිරීමේ නියෝගය ක්‍රියාත්මක වී නොතිබියදී එම වටිනාකම බැංකු ශේෂයෙන් හා ගෙවිය යුතු ශේෂයෙන් ඉවත්කර තිබීමත් සහ එම සමාගම වෙත 2023 දෙසැම්බර් 28 දින නිකුත්කර තිබූ වටිනාකම රු. 16,399,631 ක් වූ චෙක්පත අවලංගු කර තිබුණ ද, චෙක්පත සම්බන්ධයෙන් 2024 පෙබරවාරි 28 දින මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීමට පෙර දිනය දක්වාම අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබීම හේතුවෙන් සමාගමේ මුදල් හා මුදල් සමාන දෑ ශේෂය සමාලෝචිත වර්ෂය අවසානට රු.35,443,006 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	අමාත්‍යාංශයේ ලේකම්වරයා පෙබරවාරි 22 වැනි දින ලිපියක් මගින් ගිවිසුම අත්සන් කරනතෙක් ගෙවීම් ප්‍රමාද කරන ලෙස අපට උපදෙස් දෙනලදී. පිළිගැනීමේ ලිපිය නිකුත් කිරීමත් සමඟ දැනටමත් කොන්ත්‍රාත්තුව සකස් කර ඇති බැවින් ඩයලොග් වෙත ගෙවීම මුදා හැරීමට අප අදහස් කළ බැවින් ණයහිමියන් නැවත ස්ථාපිත කර නැත.	මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන දින දක්වාම ගණුදෙනු සැලකිල්ලට ගෙන ගිණුම් පිළියෙල කළ යුතුය.
ඈ)	2003 අංක 27 දරන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනත ප්‍රකාරව මුළුමනින්ම මහාභාණ්ඩාගාරයට අයත් සමාගමක් ලෙස 2003 මැයි මස 12 වන දින ඉන්ෆෝමේෂන් කොමියුනිකේෂන් ටෙක්නොලොජි ඒජන්සි ඔෆ් ශ්‍රී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම පිහිටුවා තිබුණි. 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනත යටතේ පිහිටුවා තිබුණු තොරතුරු තාක්ෂණ සභාවට (සින්ටෙක්) අයත් සියලු චංචල හා නිශ්චල දේපළ සහ සභාවේ සියළු	ICTA රජයේ පූර්ණ හිමිකාරීත්වය දරන ආයතනයක් ලෙස සැලකිල්ලට ගෙන, ICTA සංචිත යටතේ CINTEC වෙතින් ලබාගත් ශුද්ධ වත්කම් සඳහා ගිණුම්ගත කිරීම වඩාත් දූරදර්ශී ලෙස සලකනු ලැබේ.	නිවැරදිව ගිණුම් වලට ගැලපීම් සිදු කළ යුතුය.

වත්කම් සහ බැරකම් සමාගම (ICTA) වෙත පවරා තිබුණද සභාවේ එම ශුද්ධ වත්කම් ශේෂය වූ රු.5,744,115 ක් සමාගමේ ආරම්භක ප්‍රාග්ධන යෙදවීමක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශණයේ වෙනම අනාවරණය කරනු වෙනුවට 2007 වර්ෂයේදී ලාභ අලාභ ගිණුමේ ශේෂයට ගලපා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට සමුච්ත අලාභය එම වටිනාකමින් අඩුවීමට බලපා තිබුණි.

1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

විෂයය	මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.	අනුරූපී වාර්තා අනුව වටිනාකම රු.	වෙනස රු.	කළමනාකාරිත් යේඅදහස් දැක්වීම	නිර්දේශය
ලැබිය යුතු ප්‍රදාන.	1,818,995,490	1,766,863,714	52,131,776	ප්‍රදාන ලැබිය යුත්තේ අමාත්‍යාංශයෙනි.	ලැබියයුතු ප්‍රදාන අමාත්‍යාංශ පොත්පත් සමඟ සැසදිය යුතුය.

1.5.4. ඒකාබද්ධ කිරීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2022 නොවැම්බර් 15 වැනි දින පැවති සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සමාගම් පනතේ 242 වගන්තියට අනුව පරිපාලිත සමාගම වන ලංකා ගවර්මන්ට් ඉන්ෆොමේෂන් ඉන්ෆ්‍රාස්ට්‍රක්චර් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම සමග ඒකාබද්ධ කිරීමට අනුමැතිය ලබා දී තිබුණ ද 2024 අප්‍රේල් 30 දක්වා එම කාර්යය සම්පූර්ණකර නොතිබුණි. තවද, 2023 මැයි 23 දින පැවැති සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සත් දෙනෙකුගෙන් සමන්විත පරිපාලිත සමාගමේ කාර්ය මණ්ඩලය, සමාගම සමඟ ඒකාබද්ධ කිරීම අවසන් වනතුරු වෙන වෙනම පවත්වාගෙනයාමට හා එල්ජීඅයිඅයි අධ්‍යක්ෂ මණ්ඩලයට කාර්යමණ්ඩල වැටුප් සම්බන්ධයෙන් සුදුසු තීරණ ගැනීමට දක්වා තිබියදී, ඒකාබද්ධ කිරීම අවසන් කිරීමට පූර්වයෙන් සමාගමේ කාර්ය මණ්ඩලය ඒකාබද්ධ කර තිබුණි.	LGII සහ ICTA ඒකාබද්ධ කිරීම අවසන් වන තෙක් වෙන වෙනම වැටුප් ලේඛන පවත්වාගෙන යාමට 2023 මැයි 23 දින රැස්වීමේදී ගත් මණ්ඩලයේ තීරණය පිළිගනිමු.	අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව කටයුතු කළ යුතුය.

1.5.5 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අ)	මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අලාභය රු.4,120,754 ක් වූ අතර සමුච්චිත අලාභය රු.138,071,245 ක් විය. තවද, 2023 දෙසැම්බර් 31 දිනට සමාගමේ ස්කන්ධය රු. 138,071,225 ක සෘණ අගයක් ගෙන තිබුණි.	පාරිතෝෂික වියදම් ප්‍රදාන ආදායම ලෙස වර්ගීකරණය කර නොමැති අතර, වත්කම්වල ක්ෂයවීම් භාණ්ඩාගාරයෙන් ප්‍රදාන නියෝජනය නොකරයි. මෙම වියදම් දෙක මූල්‍ය ගිණුම්වල පාඩුවලට දායක වී ඇත.	අවදානම අවම කර ගැනිමට සමාගම කඩිනම් පියවර ගත යුතුය.
ආ)	අංක: 23/2443/630/009 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ 3.5 ඡේදය අනුව සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ සහ 2003 අංක 27 දරණ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනතේ ප්‍රතිපාදන අනුව, සමාගම අවසන් කිරීම සඳහා භාණ්ඩාගාර ලේකම් වෙත අධිකාරිය පවරා තිබුණු අතර 3.6 ඡේදය අනුව සමාගම භාරගෙන ඇති කෙරීගෙන යන ව්‍යාපෘති අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට පැවරීමටත්, 2023 දෙසැම්බර් 18 යන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. එසේ කටයුතු කිරීමකින් තොරව තවදුරටත් සමාගම පවත්වාගෙන යමින් පැවැතිණි.	ICTA විසුරුවා හැරීමට අමාත්‍ය මණ්ඩලය ගත් තීරණය මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් වල 2 වන සටහනේ අනාවරණය කර ඇත.	අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කල යුතුය.

1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විෂය	මුදල රු.	නොසැපයූ විගණන සාක්ෂි	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ණයහිමියෝ	2,111,459	ශේෂ සනාථකිරීම්	මෙම සැපයුම්කරුවන් 13 දෙනාගේ හිඟ ශේෂයන් කපා හැරීමට හෝ පියවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට සහ තහවුරු කිරීම් ලබා ගැනීමට කටයුතු කරන්නෙමු.	සියළු ණයහිමියන්ගෙන් ශේෂ සනාථකිරීම් ලබාගත යුතුය.

1.6. ගෙවිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා හදිසි පරිසණක ප්‍රතිචාර සංසදය (ශ්‍රී ලංකා සර්ට්) වෙත ගෙවිය යුතු රු.40,215,928 ක් 2017 වර්ෂයේ සිටම නිරවුල් කර නොතිබුණි.	ශ්‍රී ලංකා සර්ට්වෙත ගෙවිය යුතු ගිණුම් දෝෂයක් හේතුවෙන් පැන නැගී ඇත. තාක්ෂණ අමාත්‍යාංශය විසින් පත් කරන ලද කමිටුවේ සාකච්ඡාවලින් පසුව මෙම ගැටළුව විසඳනු ඇත.	ගෙවිය යුතු මුදල් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අ)	2007 අංක 07 දරන සමාගම් පනතේ 133(1) වගන්තිය.	පනත ප්‍රකාරව එක් එක් ලිත් වර්ෂයකට වරක් කොටස් හිමියන්ගේ වාර්ෂික මහා සභා රැස්වීම් පැවැත්විය යුතු වුවත් සමාගම 2017 වර්ෂයේ සිට වාර්ෂික මහා සභා රැස්වීම පවත්වා නොතිබුණු අතර 2021 වර්ෂය සඳහා පමණක් මහා සභා රැස්වීමක් පවත්වා තිබුණි.	2019 සිට 2022 වසර සඳහා මූල්‍ය ගිණුම් සැකසීමේ ප්‍රමාදය වාර්ෂික මහා සභා රැස්වීම (AGM) කැඳවීම ප්‍රමාද වීමට හේතු වී තිබේ.	**පනත අනුව කටයුතු කල යුතුය.**
ආ)	2021 නොවැම්බර් 16 දිනැති අංක: 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දීඇති ආයතනික පාලනය පිළිබඳ මෙහෙයුම් අත්පොත			
i.	3.2 ඡේදය	විධිවිධානය ප්‍රකාරව සමාගම සඳහා අනුමත බඳවාගැනීමේ පරිපාටියක් හා අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාවක් නොතිබුණි.	බඳවා ගැනීමේ ක්‍රමයක් (SOR) ක්‍රියාත්මක නොවූ නමුත් 2020 නොවැම්බර් 04 බලපැවැත්වෙන පරිදි කැබිනට් අනුමත කාර්යමණ්ඩලයක් පැවතුණි. 2023 දෙසැම්බර් 4 වැනි දින තාක්ෂණ අමාත්‍යාංශය (MOT) හරහා රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය (PED) වෙත අනුමතිය සඳහා ඉදිරිපත් කර ඇත.	මෙහෙයුම් අත්පොත ප්‍රකාරව සමාගම සඳහා අනුමත කාර්යමණ්ඩලයක් සහ බඳවාගැනීමේ පරිපාටියක් පැවැතිය යුතුය.

ii.	3.8 ඡේදය.	රජය සතු ව්‍යවසායන්හි සේවකයින්ට සන්නිවේදන පහසුකම් කලින් කළ නිකුත් කරන ලද රජයේ චක්‍රලේඛ මත පදනම් විය යුතු වුවද සමාගම චක්‍රලේඛ ප්‍රතිපාදන නොමැති ව්‍යාපෘති නිලධාරි/ව්‍යාපෘති සහායක සහ රියදුරු කාර්යය මණ්ඩලයටද දුරකථන දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේදී රු. 210,000 ක් ගෙවා තිබුණි.	කාර්ය මණ්ඩල තත්ත්වය හෝ ශ්‍රේණිය අනුව කිසිදු වෙනසක් නොමැතිව ජංගම දුරකතන දීමනා ලබා දී ඇත. මේ වසර මුළුල්ලේම ලබා දුන් දීමනාව කපා හැරීම සේවකයන් අතර නොසන්සුන්තාවයට හේතු වේ. එබැවින් දැනටමත් ලබා දී ඇති දීමනාව අඩු කරනවාට වඩා ගෙවිය යුතු අනාගත වැටුප් වර්ධකවලට එරෙහිව මෙම දීමනා ඉවත් කිරීමට සහතික වෙමු.	මෙහෙයුම් අත්පොත ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 9,342,087 අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 22,763,175 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 32,105,262 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පාරිතෝෂිත වෙන්කිරීම රු.11,903,300 ක් ඒකාබද්ධ ලාභ අලාභ ප්‍රකාශනයට ඇතුලත් කරනු වෙනුවට විස්තීරණ ආදායම් ප්‍රකාශනයට ඇතුලත් කිරීම හා විලම්බිත ආදායම රු. 5,387,397කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අ)	“ඊ පුස්තකාල” ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සඳහා බිල් ඇන්ඩ් මෙලින්ඩා ගේට්ස් ෆවුන්ඩේෂන් වෙතින් ලබාදී තිබූ රු. 121,582,863 ක් වූ මුදලින් එම ව්‍යාපෘති ක්‍රියාත්මක නොකර, 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේදී වෙනත් ආදායම් ලෙස සමාගමේ ආදායමට ගෙන තිබුණි.	Bill & Melinda Gates පදනම මෙම අරමුදල් ලබා දුන්නේ පුණ්‍ය පරිත්‍යාගයක් ලෙස වන අතර, පරිගණක සහ අන්තර්ජාලය වෙත නොමිලේ ප්‍රවේශය හරහා පුද්ගලයින් තොරතුරු වෙත සම්බන්ධ කිරීම සඳහා මහජන පුස්තකාල සඳහා ව්‍යාපෘතියක් සඳහා මුදල් ලැබීඇත.	ව්‍යාපෘති සඳහා ලැබෙන මුදල් ඒ සඳහාම භාවිතා කල යුතුය.
ආ)	සේවකයින් 30 දෙනෙකු සඳහා වැටුප් වර්ධක ලබාදීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය ලබාදුන් ප්‍රධාන තීරණයට පටහැනිව වැටුප් වර්ධක ලබාදී තිබීම හේතුවෙන් එම වැටුප් සංශෝධන බල රහිත බව සමාගම වෙත 2023 සැප්තැම්බර් 14 දිනැති අංක ඊ/112/2023/අයිසීටීඒ දරන නීතිපතිගේ ලිපිය මගින් දැනුම් දී තිබුණි. ඒ අනුව සමාගම සමාලෝචිත වර්ෂයේදී රු. 7,211,465 ක් වැටුප් ලෙස වැඩිපුර ගෙවා තිබුණි.	2024 මාර්තු මාසයේ සිට, වැටුප් ගැලපීම් අඩු කිරීමෙන් පසු වැටුප් ගෙවීමට අපට අරමුදල් ලැබුණු බැවින් මෙම වැටුප් ගැලපීම් අඩු කිරීමට අපට සිදුවිය. මෙම අඩුකිරීම් සම්බන්ධයෙන් සේවකයින් සිය අතෘප්තිය ප්‍රකාශ කර ඇති අතර කම්කරු දෙපාර්තමේන්තුවට පැමිණිලි කර ඇත.	අනුමත වැටුප් පරිමාණයන්ට අනුව ගෙවීම් කළ යුතුය. වැඩිපුර ගෙවූ වැටුප් අය කර ගත යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති අවලංගු කිරීම හේතුවෙන් උසාවි ස්වයංකරණ ව්‍යාපෘතිය සඳහා ලැබී තිබුණු රු. 27,253,057 ක් හා වීඩියෝ සම්මන්ත්‍රණ ව්‍යාපෘතිය සඳහා ලැබී තිබුණු රු. 61,996,498 ක් ආපසු ගෙවීමට සිදුවී තිබුණි.	මෙම ව්‍යාපෘතිය සඳහා ලැබුණු මුදල් අදාළ පාර්ශව වෙත ආපසු ලබා දී ඇත.	සැලසුම්කළ ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය.

3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
උසාවි ස්වයංක්‍රියනය (Court Automation) ව්‍යාපෘතිය සඳහා අධිකරණ බන්ධනාගාර කටයුතු සහ ව්‍යවස්ථා අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු මුදල්, ආපසු ගෙවීමේදී රු. 506,558 ක මුදලක් සමාගම විසින් වෙනත් ව්‍යාපෘති (පරිපාලන වගකීම්) ලෙස තවදුරටත් රඳවාගෙන ගිණුම්වල ඉදිරියට ගෙනවිත් තිබුණි.	දැනට අවසන් කර ඇති අධිකරණ ස්වයංක්‍රියකරණ ව්‍යාපෘතිය සඳහා සමාගමේ පරිපාලන වියදම් පියවා ගැනීමට ලැබුණු මුදල ලාභ අලාභ ගිණුමේ ආදායම ලෙස හඳුනාගෙන නොමැත.	ආදායම හඳුනාගත් පසු ගිණුම්ගත කළ යුතුය.

3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
කාර්ය මණ්ඩලය 235 ක් සඳහා ප්‍රමාණවත් ගොඩනැගිල්ලක් කුලී පදනම මත ලබාගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේ තථ්‍ය කාර්යමණ්ඩලය 75 ක්වූයෙන් වර්ග අඩි 10320 ක් සඳහා ගොඩනැගිලි කුලිය රු.21,054,840 ක් නිෂ්කාර්යව ගෙවා තිබුණු අතර රු.16,048,194 ක් වටිනා කාර්යාල ගෘහ භාණ්ඩද ඌන උපයෝජිතව පැවැතුණි.	සමාගම අවසන් කිරීමට කැබිනට් මණ්ඩලය ගත් තීරණය හේතුවෙන් දැනට සේවකයින් බඳවා ගැනීම සීමා කිරීම ඉඩ පහසුකම් මෙන්ම ගෘහ භාණ්ඩ ඌන ප්‍රයෝජනයට ගැනීමට හේතු වනු ඇත.	වත්කම් උපරිම කාර්යක්ෂමතාවයෙන් උපයෝජනය කළ යුතුය.

3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජිත ආයතනයේ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමකින් තොරව හා ගිවිසුමකට එළඹීමෙන් තොරව සමාගමේ ලිපිගොනු ගබඩා පහසුකම් ලබාගැනීම වෙනුවෙන් පෞද්ගලික සමාගමක් වෙත සමාලෝචිත වර්ෂයේදී රු. 1,677,656 ක් ද, වාහන නැවැත්වීම සඳහා පෞද්ගලික පාර්ශවයකින් රු.96,000 ක මාසික කුලියකට ඉඩමක් ලබාගැනීම සඳහා 2021 නොවැම්බර් සිට 2023 දෙසැම්බර් දක්වා වූ කාල පරිච්ඡේදය වෙනුවෙන් රු.2,496,000 ක් ද වැයකර තිබුණි.	මෙම ප්‍රසම්පාදන ගොනුව සොයා ගැනීමට නොහැකි විය. මෙම පහසුකම සඳහා අවශ්‍යතාවය පැන නැගුනේ පෙර ගොඩනැගිල්ලේ තිබූ සීමිත ඉඩකඩ හේතුවෙනි. මිල සංශෝධන කිසිවක් නොමැති වුවද, ගිවිසුම දිගටම පැවතුණි.	සියළු ප්‍රසම්පාදනයන් මාර්ගෝපදේශයන්ට අනුකූලව සිදු කළ යුතුය.

3.6 වෙනත් සංවිධානවලට මුදාහැරී සම්පත්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 නොවැම්බර් 16 දිනැති අංක: 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දීඇති ආයතනික පාලනය පිළිබඳ මෙහෙයුම් අත්පොත 3.5 ඡේදය ප්‍රකාරව රජය සතු ව්‍යවසායන්හි සේවකයෙකු අමාත්‍යාංශයකට හෝ වෙනත් ආයතනයකට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය නොමැතිව නිදහස් නොකළ යුතු අතර මුදාහරින ලද කාලපරිච්ඡේදයන් තුළ කිසිදු දීමනාවක් නොගෙවිය යුතු වුවත් සමාගම එක් නිලධාරිනියක් එසේ අනුමැතිය නොමැතිව තාක්ෂණ අමාත්‍යාංශයට මුදාහැර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේදී වැටුප් හා දුරකථන දීමනා ලෙස පිළිවෙලින් රු.1,948,000ක් හා රු.2,066,400 ක් ගෙවා තිබුණි.	අමාත්‍යාංශ ලේකම්ගේ ඉල්ලීම අනුව තාක්ෂණ අමාත්‍යාංශය වෙත මුදා හැරීමට සිදු විය.	චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 සංයුක්ත සැලැස්ම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 නොවැම්බර් 16 දිනැති අංක: 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දීඇති ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 2.3 වගන්තිය ඡේදය ප්‍රකාරව උපායමාර්ගික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම හා අයවැය වසර ආරම්භයට දින 15 කට පෙර රේඛීය අමාත්‍යාංශය හරහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාගම ඒ අනුව කටයුතු කර නොතිබුණි.	අයවැය චක්‍රලේඛ අංක 05/2022 හි දක්වා ඇති විධානයන්ට අනුකූලව අයවැය පිළියෙලකර අමාත්‍යාංශය වෙත ඉදිරිපත්කර ඇත. ක්‍රියාකාරී සැලැස්ම සහ උපායමාර්ගික සැලැස්ම ද රාජ්‍ය ව්‍යාපාර වෙත යවන ලද නමුත්, අදාළ ලියකියවිලි පහසුවෙන් සොයා ගත නොහැකි විය.	මාර්ගෝපදේශයට අනුකූලව උපායමාර්ගික සැලසුම හා ක්‍රියාකාරී සැලසුම පිළියෙල කළ යුතුය.